| | |
|---|---|
| 1. පිවිසුම් ගේට්ටුව හා පිටවන ස්ථාන අසල, වැසිකිලි පද්ධති අසල හැකි නම් පන්ති කාමරවලට ආසන්නයව ප්‍රමාණවත් පරිදි සබන් කැට හෝ දියර සහිතව අත් සේදීමේ පහසුකම් සකස් කර තිබීම. | |
| 2. සුදුසු පරිදි අඛණ්ඩ ජල සැපයුම් ක්‍රම සකස් කරගැනීම | |
| 3. දැනට වෙනත් කාර්යයන් සඳහා පාසල භාවිතයට ගනු ලබන්නේ නම් ආරම්භයට දින තුනකට පෙරවත් එම කාර්යයන් අවසන් කිරීම. | |
| 4. පාසල පිරිසිදු කිරීම හා මදුරුවන්ගෙන් තොර පරිසරයක් පවතින බවට හා අනතුරුවලින් තොර පරිසරයක් පවතින බවට ද තහවුරු කර ගැනීම | |
| 5. ශරීර උෂ්ණත්වය බැලීම සඳහා උපකරණ පැවැතීම හා ක්‍රමවේද හඳුනා ගැනීම | |
| 6. යම් කිසි සිසුවෙකු රෝගී තත්වයකින් පෙළෙන්නේ නම් අනෙක් සිසුන්ගෙන් වෙන් කර තැබීම සඳහා ගිලන් කාමරයක් පැවැතීම හා එහි අවශ්‍ය අවම උපකරණ පැවැතීම | |
| 7. ශිෂ්‍යයෙකු හෝ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු පාසල් කාලය තුළ අසනීප වුවහොත් ගතයුතු ක්‍රියාමාර්ග හඳුනාගෙන තිබීම හා සැලැස්මක් තිබීම | |
| 8. අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල දැනුවත් කිරීම, වගකීම් පැවරීම හා අවශ්‍ය පුහුණුව ලබා දීම. | |
| 9. පුද්ගල දුරස්ථභාවය, නිවැරදිව අත්සේදීම හා එහි වැදගත්කම සහ මුඛ ආවරණ භාවිතයේ වැදගත්කම පහදා දෙන කරුණු අන්තර්ගත පුවරු ප්‍රදර්ශනය කිරීම | |
| 10. මාපියන් සහ පාසල් ප්‍රජාව (පාසල් සංවර්ධන සමිතිය, ආදීශිෂ්‍ය සංගමය...) දැනුවත් කිරීම | |
| 11. හදිසි අවස්ථාවක දී භාවිතයට ගැනීමට මුඛ ආවරණ ප්‍රමාණවත්ව පාසල තුළ පවති. (සකස් කර ගත් ඒවා වුව ද සුදුසු වේ) | |
| 12. සනීපාරක්ෂක කම්කරුවන් හා පාසල් කම්කරුවන් සඳහා සෞඛ්‍යාරක්ෂිත ක්‍රම භාවිතය සඳහා සූදානම (අවශ්‍ය මුඛ ආවරණ, අත්වැසුම් යනාදිය) | |
| 13. විෂබීජහරණය සහ දෑත් සේදීම සඳහා සබන් දියර/විෂබීජනාශක දියර ප්‍රමාණවත්ව පවති. | |
| 14. සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව සක්‍රියව පවති. | |